**විසර්ජන ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**විගණකාධිපති වාර්තාව -2012 වර්ෂය**

---

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිළිඳුකම අඩුකිරීම සඳහා වන මූලපිරීම

(ආ) මැතිවරණ සම්බන්ධීකරණය

(ඇ) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය

(ඈ) ආපදා සහන ව්‍යාපෘති හා පුනරුත්ථාපන ව්‍යාපෘතීන් පරිපාලනය

(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘතීන් පරිපාලනය හා මඟ පෙන්වීම

(ඊ) ආදායම් එකතු කිරීම

**1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇත ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (අ) | අත්තනගල්ල | (ඉ) | ගම්පහ | (එ) | මහර | (ක) | වත්තල |
| (ආ) | බියගම | (ඊ) | ජාඇල | (ඒ) | මිනුවන්ගොඩ | | |
| (ඇ) | දොම්පෙ | (උ) | කටාන | (ඔ) | මීරිගම | | |
| (ඈ) | දිවුලපිටිය | (ඌ) | කැළණිය | (ඕ) | මීගමුව☐ | | |

**1.3 විගණන විෂය පථය**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 17 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා සහ පහත 1.6 සිට 1.14 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණ බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| හානි හා පාඩු ලේඛනය | මුදල රෙගුලාසි.110 |
| ගබඩා තොග ලේඛනය | මුදල් රෙගුලාස.454 |
| ඉන්වෙන්ට්‍රි ලේඛන | මුදල් රෙගුලාස751 |

(ආ) <u>විසර්ජන ගිණුම</u>

(i) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා උස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.803,534,134 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.790,517,139 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 13,016,995ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.6ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 583,375,000 | 775,584,134 | 10,304,829 | 1.3 |
| මූලධන | 27,950,000 | 27,950,000 | 2,712,166 | 9.7 |
| එකතුව | 611,325,000 | 803,534,134 | 13,016,995 | 1.6 |

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 21කින් හා දෙපාර්තමේන්තු 13 කින් පිළිවෙලින් රු.2,887,146,236 ක් හා රු.2,908,670,634 ක් වශයෙන් එකතුව රු.5,795,816,870 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර, එයින් පිළිවෙලින් රු.2,635,849,777 ක් හා රු.2,855,387,481 ක් වශයෙන් එකතුව රු.5,491,237,258 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.304,579,612 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඇ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම</u>**

**<u>පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්</u>**

විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සමාවන් හා සත්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | සත්‍ය | අවම සීමාව | සත්‍ය | උපරිම සීමාව | සත්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 65,000,000 | 64,827,955 | 53,500,000 | 56,972,662 | 232,500,000 | 228,105,663 |

විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,155,041 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂවල එකතුව රු.366,506,661 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.134,392,723 ක්වූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) පුහුණු වැඩ සටහනක් පැවැත්වීම සඳහා ජාතික ළමා රක්ෂක අධිකාරියෙන් ලබාදී තිබුණු රු.10,000 ක මුදලින් අදාළ කාර්යය ඉටු නොකර ආපසු යවා තිබුණි.

## 1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙළ කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 1.6.1 ජේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.3 වාර්ෂික කාර්යසාධන වාර්තා

ඉහත 1.6.1 ජේදය පරිදි රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව 2013 ඔක්තෝබර් 02 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට යවා ඇත යනුවෙන් දිස්ත්‍රික් ලේකම් විසින් දනවා තිබුණි.

### 1.6.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කළයුතු වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.5 අභ්‍යන්තර විගණනය

2012 අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩ සටහනට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 න් කාර්යාල 7ක් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණ අතර, සමාලෝචිත වර්ෂයේ මැයි මස සිට දෙසැම්බර් දක්වා මාසික ඉදිරි වැඩ සටහන්ද සකස් කර නොතිබුණි.

### 1.6.6 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයට අනුව කාර්තුවකට අවම වශයෙන් එක් වතාවක් වත් වනසේ විගණන හා කළමනාකරණ කමිටුව රැස්විය යුතු වුවද, 2012 වර්ෂය වෙනුවෙන් කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

(අ) **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත වර්ගකර ඇති පරිදි සමහර වත්කම් නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
| --- | --- | --- |
| ගොඩනැගිලි | 05 | වර්ෂ 2 ට අඩු |
| වෙනත් වත්කම් | 05 | වර්ෂ 2 ට අඩු |

(ආ) <u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම</u>

2012 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්</u>

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කැබ්රථයක් 2012 ජූලි මාසයේ සිට අවිධිමත් ලෙස කාර්මික සංවර්ධන මණ්ඩලය වෙත මුදාහැර තිබුණි.

**(ඈ)** නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(i) 2007 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදීගෙන තිබුණු කාර්යාල උපකරණ අයිතම 168 ක් ගබඩාවෙන් නිකුත්කර තිබුණද, ඒ පිළිබඳ විස්තර අදාළ අංශවල ඉන්වෙන්ට්‍රි ලේඛනවලට ඇතුළත්කර නොතිබුණි.

(ii) ලැබීම් පිළිබඳ විස්තර ගබඩා තොග ලේඛනයේ සටහන්ව තිබුණද, නිකුත් කිරීම පිළිබඳ සටහන් තබා නොතිබුණු පරිගණක 22 ක් ගබඩාවේද නොතිබුණි.

(iii) 2012 දෙසැම්බර් 31 දිනට රු.711,639 කට මිලට ගෙන තිබුණු අයිතම 130 ක ලැබීම් පිළිබඳ විස්තර ගබඩා තොග පොතේ සටහන් කර නොතිබුණු අතර, එම උපකරණ නිකුත් කිරීම පිළබඳ විස්තරද, සටහන් කර නොතිබුණි.

(iv) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු විවිධ වර්ගවලට අයත් අයිතම 53 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ට බෙදාහැර තිබුණු අතර, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලැබීම් නිවේදන එවා නොතිබුණි.

1.8 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (i) <u>ව්‍යවස්ථාපිත විධිවිධාන</u> | | |
| 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ | 6,067,729 (ඇස්තමේන්තු) | (i) ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරි යුගල නිල නිවාස ඉදිකිරීමේ කාර්යය සඳහා මිල |

| | | | |
|---|---|---|---|
| 6(1) උප වගන්තිය | | | ගණන් ලබාදී තිබුණු කොන්ත්‍රාත්කරුවන් 6 දෙනා පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී නොතිබුණි. |
| | | (ii) | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරි යුගල නිල නිවාස ඉදිකිරීමේ කාර්යය සඳහා වූ ටෙන්ඩර් ගිවිසුම දින 60 ක් තුළ ලියාපදිංචිකර නොතිබුණි. |
| 12 වන වගන්තිය | 6,067,729 (ඇස්තමේන්තු) | (i) | වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැති කොන්ත්‍රාත්කරුවන්ගේ මිල ගණන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ඇගයීම් කටයුතු සිදු කර තිබුණි. |

(ii) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 570 | | එකතුව රු.1,822,080 ක්වූ ඉඩම් තැන්පතු ශේෂ 19 ක් වර්ෂ 10 සිට 27 දක්වා කාලයක් තුළ නිරවුල් කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 756 | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිගණක පුහුණු මධ්‍යස්ථානයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණය කර නොතිබුණි. |

(iii) <u>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය</u>

| | | |
|---|---|---|
| 2.7.7 මාර්ගෝපදේශය | 884,130 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ප්‍රසම්පාදන කමිටු තීරණයක් මත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලිඛිත මිලදී ගෙන තිබුණි. |
| - එම - | 129,716 | ව්‍යාජ ලෙස ඉදිරිපත් කර තිබුණු මිල ගණනක්ද තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන තීරණවලදී උපයෝගී කරගෙන තිබුණි. |

(iv) <u>භාණ්ඩාගාර චක්‍රලේඛ</u>

| | | |
|---|---|---|
| 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව පවතින සියළුම පරිගණක සහ උපාංග සම්බන්ධයෙන් වූ විස්තර අනාවරණය |

වන පරිදි පරිගණක වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

1.9 **වයාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

වයාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

(i) මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පහත සඳහන් ව්‍යාපෘතිය ඉටු කිරීමේ ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| ඇටිකෙහෙල්ගල්ල බටහිර ජල ව්‍යාපෘතිය | 980,000 | 2012.12.17 | 2012.12.31 | 834,308 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ජල නල එළීමේ කටයුතු ප්‍රමාදවීම. |

(ii) 2012 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 2421 න් 2012 දෙසැම්බර් 31 දිනට නිම නොකළ ව්‍යාපෘති සංඛ්‍යාව 97ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | නිමකළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|
| | රු. | | රු. | |
| එක ගමකට එක වැඩක් | 101,237,863 | 2012.12.31 | 9,903,965 | මුදල් ප්‍රතපාදන ලැබීම ප්‍රමාදවීම. ප්‍රමාද වී වැඩ ආරම්භ කිරීම. |
| විශේෂ ව්‍යාපෘති | 4,800,000 | 2012.12.31 | 481,292 | මුදල් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාදවීම. ප්‍රමාද වී වැඩ ආරම්භ කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| ගමනැගුම | 10,585,000 | 2012.12.31 | 8,248,500 | මුදල් ප්‍රතිපාදන ලැබීම ප්‍රමාදවීම. ප්‍රමාද වී වැඩ ආරම්භ කිරීම. |

(ආ) <u>මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති</u>

කිරිකිත්ත බටහිර ජල යෝජනා ක්‍රමයේ වැඩ අවසන් කිරීම හා ජල යෝජනා ක්‍රමයේ පොම්පකරන නල මාර්ගයේ මීටර් 520 ක් සඳහා ජලනල උපාංග සපයා එළීමේ ව්‍යාපෘතිය සඳහා 2012 නොවැම්බර් 29 දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට රු.892,436 ක් වූ මුළු මුදලම ගෙවා තිබුණද, 2013 ජුනි 03 දින වන විටද ව්‍යාපෘතියේ කිසිදු වැඩ කොටසක් ආරම්භ කර නොතිබුණි.

1.10 <u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>

ගබඩා තොග පොතට අනුව නිකුත් කළ දිනයන් කවරේද යන්න සඳහන් කිරීමකින් තොරව මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර්ස් 4 ක් පාලන අංශයට නිකුත් කර තිබුණද, භෞතික පරීක්ෂාවට අනුව රු.58,000 ක් වටිනා එක් මල්ටිමීඩියා ප්‍රොජෙක්ටරයක ඌනතාවයක් අනාවරණය විය.

1.11 <u>අවිධිමත් ගනුදෙනු</u>

<u>අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු</u>

කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 30' x 20' ප්‍රමාණයේ ගොඩනැගිල්ලේ පළමු මහළ ඉදි කිරීමේදී අතිරික්ත සහ අමතර වැඩ සඳහා පිළිවෙලින් රු.147,007 ක් සහ රු.366,733 ගෙවා තිබුණද, ඒ සඳහා වු අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

1.12 <u>අනාර්ථික ගනුදෙනු</u>

පහත සඳහන් අනාර්ථික ගනුදෙනු නිරීක්ෂණය විය.

(අ) කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 30' x 20' ප්‍රමාණයේ ගොඩනැගිල්ලේ බිම් මහළ ඉදි කිරීමේදී අතිරේක සහ අතිරික්ත වැඩ සමඟ මුළු කාර්යයේ වටිනාකම රු.1,874,793 ක් වුවද, 2012 දෙසැම්බර් 31 දින ගෙවීම් කිරීමේදී මුළු කාර්යයේ වටිනාකම රු.1,961,034 ක් ලෙස දක්වා තිබීමෙන් රු.86,241 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 4 කින් 2011 සහ 2012 වර්ෂවලදී ආධාරලාභීන් වෙත බෙදාදී තිබුණු රු.3,810,000 ක් පිරිවැය වූ කිකිළි පැටවුන් 10400 න් රු.1,029,000 ක්වූ සියයට 28සමාන ප්‍රමාණයක කිකිළි පැටවුන් මියගොස් තිබීම සහ රු.606,550 ක්වූ සියයට 18 සමාන ප්‍රමාණයක් කුකුළු පැටවුන් වීම තුළ සමස්ථ වියදමෙන් සියයට 45 සමාන රු.1,635,550 ක මුදලක් අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

1.13 <u>කළමනාකරණ දුර්වලතා</u>

<u>විසඳා නොතිබුණු විගණන ඡේද</u>

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු නිම නොවූ ඡේද පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2006 | 2.4 | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම 2006 දෙසැම්බර් 31 දින ට අයවීම් හිඟ හිරි ණය ශේෂවල එකතුව රු.4,413,253 ක් වූ අතර එයින් රු.474,658 ක් වසර 02ට වඩා පැරණි ශේෂයන් විය. |
| 2006 | 9.2 | කළමනාකරණ හා විගණන කමිටුව ක්‍රියාත්මක කිරීම |
| 2006 | 10.8 | කැලණිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රජයට අයත් පොදු ගොඩනැගිලිවල ග්‍රාම නිලධාරි කාර්යාල 16 ක් පිහිටුවා තිබුණු අතර ඒ සඳහා වර්ෂ ගණනාවක සිට කාර්යාල දීමනා ගෙවා තිබුණි. |

1.14 <u>මානව සම්පත් කළමනාකරණය</u>

<u>අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා</u>

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 45 | 42 | 03 | |
| (ii) තෘතියික මට්ටම | 27 | 22 | 05 | |
| (iii) ද්විතියික මට්ටම | 1639 | 1336 | 303 | |
| (iv) ප්‍රාථමික මට්ටම | 128 | 110 | 18 | 02 |
| එකතුව | 1839 | 1510 | 329 | 02 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 329 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.

(ii) ස්ථාන මාරුවීම් මත දිස්ත්‍රික් කාර්යාලයට එවා තිබෙන රියදුරන් දෙදෙනෙකුගේ අතිරික්තයක් සිදුවී තිබුණි.